සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# කතෝලික ධර්මය

07 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I කොටස

- අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. "ප්‍රොෆෙටෙස්" යන්නෙහි අර්ථය වන්නේ,

(1) දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන තැනැත්තා ය.

(2) දෙවියන් වහන්සේ අප සමඟය.

(3) දෙවියන් වහන්සේ කැඳවන සේක.

(4) දෙවියන් වහන්සේ අප ගලවන සේක.

02. දේශක දිවැසිවරයෙකු වන්නේ,

(1) එළියා ය. (2) යෙසායා ය.

(3) ජෙරමියා ය. (4) එසකියෙල් ය.

03. ප්‍රධාන දිවැසිවරයෙකු වන්නේ,

(1) හොසියා ය. (2) ජොවෙල් ය.

(3) ආමොස් ය. (4) ජෙරමියා ය.

04. නියං සමයක දී දිව්‍ය සංරක්ෂණය අත්දුටු දිවැසිවරයා වන්නේ,

(1) එළීෂා දිවැසිවරයා ය. (2) නාතාන් දිවැසිවරයා ය.

(3) එළියා දිවැසිවරයා ය. (4) හොසියා දිවැසිවරයා ය.

05. 'දෙවියන් වහන්සේ ගලවන සේක.' යන නමෙහි අර්ථය ඇති දිවැසිවරයා වන්නේ,

(1) ජෙරමියා දිවැසිවරයා ය. (2) යෙසායා දිවැසිවරයා ය.

(3) එසකියෙල් දිවැසිවරයා ය. (4) ආමොස් දිවැසිවරයා ය.

06. ජෙරමියා දිවැසිවරයාගේ පියාගේ නාමය වන්නේ,

(1) ආමෝස් ය. (2) බූසී ය.

(3) හිල්කියා ය. (4) සෙකරියස් ය.

07. සමාජ සාධාරණත්වයේ දිවැසිවරයා ලෙස හඳුන්වන්නේ,

(1) ජෝනා දිවැසිවරයා ය. (2) මලාකි දිවැසිවරයා ය.

(3) හග්ගයි දිවැසිවරයා ය. (4) ආමොස් දිවැසිවරයා ය.

08. "මම නුඹට බොහෝ දරු සම්පත් දෙමි. නුඹෙන් ................ උපදවන්නෙමි; නුඹෙන් ................. පහළ වන්නාහ.

(1) රජවරු, ජාතීන්. (2) ජාතීන්, රජවරු.

(3) දරු සම්පත්, දිවැසිවරු. (4) සෙනඟ, රජවරු

09. දෙවියන් වහන්සේ ආබ්‍රහම්තුමා සමග ඇති කරගත් ගිවිසුමේ බාහිර සලකුණ වන්නේ,

(1) පූජා කිරීමයි. (2) කැප කිරීමයි.

(3) චර්මඡේදනයයි. (4) දේදුන්නයි.

10. 'ආබ්‍රම්' යන්නෙහි අර්ථය වන්නේ,

(1) උතුම් පියා යන්නය. (2) ජාතීන්ගේ පියා යන්නය.

(3) විශ්වාසයේ පියා යන්නය. (4) දිවැසිවරුන්ගේ පියා යන්නය.

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ලියන්න.**

11. මනුෂ්‍ය සංහතිය පාපයෙන් ගලවා ගැනීමට දෙවියන් වහන්සේ දුන් පොරොන්දු ඉටු කිරීමට තෝරා ගත් පළමු තැනැත්තා .................................... ය.

12. මනස්ථාපනය තුළින් දෙවියන් වහන්සේගේ කරුණාවට නිනිවයේ ජනතාව යොමු කළේ ................................................................. ය.

13. සිරියාවේ රජතුමාගේ සෙන්පතියා වූ ................................................................. එලීෂා දිවැසිවරයා විසින් සුව කළේය.

14. ................................................................. මත එලියා දිවැසිවරයා හා බාල් දෙවියන්ගේ දිවැසිවරු යාග සූදානම් කළහ.

15. පොරොන්දු දේශය .......................................................................................... යන නමින් ද හඳුන්වයි.

(ඔලිව් කන්ද, නාමන්ගේ කුෂ්ඨය, ආබ්‍රහම්, කානාන් දේශය,
කාර්මේල් කන්ද, ජෝනා, හොසියා)

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

16. නියගයකදී කෙරිත් ඔය අසබඩ වාසය කළේ නාතාන් දිවැසිවරයාය. ( )

17. දේශක දිවැසිවරුන් පිළිබඳ ව තොරතුරු ජෝවෙල් ග්‍රන්ථයෙහි සඳහන් වේ. ( )

18. ඊසාක් තුමා උපත ලබන විට ආබ්‍රහම්ගේ වයස අවුරුදු 100 කි. ( )

19. එසකියෙල් දිවැසිවරයා බැබිලෝනියේ සිට ඉශ්‍රායෙල් ජනතාවට දෙවියන් වහන්සේගේ පණිවිඩය ප්‍රකාශ කළේය. ( )

20. දාවිත් රජතුමා විසින් කළ වරද පෙන්වා දුන්නේ නාතාන් දිවැසිවරයා ය. ( )

(ල. 5x2 = 10)

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (1) පුරාණ ගිවිසුමේ දිවැසිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් 02 ක නම් කරන්න.

(2) ජෙරමියා හා එසකියෙල් දිවැසිවරුන්ගේ නම් වල අර්ථ ලියන්න.

(3) ආදි පිතෘ ජාකොබ් තුමා දුටු දර්ශන 02 ක් ලියන්න.

(4) ආබ්‍රහම් තුමාගේ කැඳවීමේ අංග 2 ක නම් කරන්න.

(5) දේශක දිවැසිවරුන් පිළිබඳව තොරතුරු සඳහන් වන පුරාණ ගිවිසුමේ ග්‍රන්ථ 02 ක් ලියන්න.

(6) දේශක දිවැසිවරුන් දෙදෙනෙකු නම් කරන්න.

(7) දෙවියන් වහන්සේ ඊසාක් තුමා මගින් ගිවිසුම අලුත් කළ ස්ථානය ලියන්න.

(8) ඊසාක් තුමාගේ පුතුන් දෙදෙනා නම් කරන්න.

(9) දේව කැඳවීම තුළ ජීවත් වීමට ඔබට කළ හැකි දේවල් 02 ක් ලියන්න.

(10) බෙතෙල් යන්නෙහි අර්ථය ලියන්න. (ල. 2x10=20)

02. (1) ග්‍රීක හා හෙබ්‍රෙව් බසින් දිවැසිවරයා හැඳින්වීමට යොදන වචන පිළිවෙලින් ලියන්න. (ල. 02)

(2) සුළු දිවැසිවරුන් තිදෙනෙකු නම් කරන්න. (ල. 03)

(3) දිවැසිවරුන්ගේ ජීවිත තුළින් ගත හැකි නායකත්වයේ ගුණාංග 05 ක් ලියන්න. (ල. 05)

03. (1) ආබ්‍රහම් තුමාගේ කැඳවීම තුළින් පරිත්‍යාග කිරීමට සිදු වූ දේවල් 2 ක් ලියන්න. (ල. 02)

(2) ආබ්‍රහම් තුමාට මුහුණ දීමට සිදු වූ අභියෝග 03 ක් ලියන්න. (ල. 03)

(3) ආබ්‍රහම් තුමාගේ කැඳවීම තුළින් ගත හැකි ආදර්ශ 05 ක් ලියන්න. (ල. 05)

04. (1) ආබ්‍රහම් තුමා සමඟ ඇති කර ගත් ගිවිසුමේ වැදගත් කරුණු 02 ක් ලියන්න. (ල. 02)

(2) දෙවියන් වහන්සේ වෙනුවෙන් පොරොන්දු ඉටු කළ ආදි පියවරු තිදෙනෙකු නම් කරන්න. (ල. 03)

(3) ප්‍රසාද ස්නාපනය ලැබූ ඔබට මීසම තුළ කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න. (ල. 05)

05. (1) ඊසාක් යන නමෙහි අර්ථය ලියන්න. (ල. 02)

(2) දෙවියන් වහන්සේ ඊසාක් තුමා දිරිමත් කරමින් වදාළ ප්‍රකාශ 03 ක් ලියන්න. (ල. 03)

(3) ඊසාක් තුමාගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ 05 ක් ලියන්න. (ල. 05)

06. (1) 'ඔහු රතු පාටය. ඔහුගේ ඇග පුරා ලෝම වැස්මක් මෙන් විය.' මෙසේ සඳහන් වන්නේ කවුරුන් පිළිබඳවද? (ල. 02)

(2) ඒසව් සමඟ ජාකොබ් සමගිවීමෙන් ලබා ගතහැකි ආදර්ශ 03 ක් ලියන්න. (ල. 03)

(3) පන්ති කාමරයේ දී අසමගියෙන් සිටින මිතුරන් දෙදෙනෙකුට ඔබට දිය හැකි උපදෙස් 05 ක් ලියන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 1 ) 02. ( 1 ) 03. ( 4 ) 04. ( 3 ) 05. ( 2 ) 06. ( 3 ) 07. ( 4 ) 08. ( 2 ) 09. ( 3 ) 10. ( 1 )

11. ආබ්‍රහම් ය. 12. ජෝනා ය. 13. නාමන්ගේ කුෂ්ඨය 14. කාර්මෙල් කන්ද 15. කානාන් දේශය

16. (X) 17. (X) 18. (✓) 19. (✓) 10. (✓)

## II කොටස

01. (1) දේශක දිවැසිවරු හා ලේඛක දිවැසිවරු
(2) ජෙරමියා - දෙවියන් වහන්සේ උසස් කළ සේක. එසකියල් - දෙවියන් වහන්සේ ගලවන සේක.
(3) ★ බෙතෙල්හි දර්ශනය ★ පෙනුයෙල්හි දර්ශනය
(4) ★ පරිත්‍යාගය ★ අභියෝගය
(5) ★ I සාමුවෙල්, II සාමුවෙල් ★ I රාජාවලිය, II රාජාවලිය
(6) ★ එළියා දිවැසිවරයා ★ එලීෂා දිවැසිවරයා ★ නාතාන් දිවැසිවරයා
(7) බෙයර්ෂෙබා වලදී ය. (8) ඒසව් හා ජාකොබ්ය.
(9) ★ තම කැඳවීමට අවනත වීම. ★ යහපත් ජීවිතයක් ගත කිරීම. ★ වගකීම් නිසි ලෙස ඉටු කිරීම. ★ දිව්‍ය පූජාවට සහභාගී වීම.
(10) දෙවියන් වහන්සේගේ ගෘහය ය. (ල. 2x10=20)

02. (1) ★ ග්‍රීක් බසින් - ප්‍රොෆෙටෙස් හෙබ්‍රෙව් බසින් - නබී (ල. 02)
(2) ★ හොසියා ★ ජෝනා ★ ශෙපනියා ★ ජෝවෙල් ★ මීකා ★ හග්ගයි ★ ආමෝස් ★ නාහුම් ★ සෙකරියා ★ ඔබදියා ★ හබක්කුක් ★ මලාකි (ල. 03)
(3) ★ අධ්‍යාත්මික ගුණයෙන් වර්ධනය වීම. ★ අභියෝගවලට මුහුණ දීම. ★ වගකීම් භාර ගැනීම. ★ සාමූහිකව වැඩ කිරීම. ★ ජේසුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීම. ★ සේවයේ දිවියට කැපවීම. ★ ඉවසීම, කැපවීම, දයාව, පරිත්‍යාගය (ල. 05)

03. (1) ★ තමාගේ මව්බිම. ★ පියාගේ ගෘහය ★ තමාගේ නෑදෑයන් (ල. 02)
(2) ★ විශාල ජාතියක් ඇති කිරීම. ★ සංචාරක ජීවිතයක් ගත කිරීමට සිදුවීම. ★ නොදන්නා දේශයකට යාමට සිදුවීම. (ල. 03)
(3) ★ කැඳවීමට අවනත වීම. ★ උපරිමයෙන් දෙවියන් වහන්සේට සේවය කිරීම. ★ දෙවියන් වහන්සේ කෙරෙහි පූර්ණ විශ්වාසය තැබීම. ★ පරිත්‍යාගී ජීවිතයක් ගත කිරීම. ★ ජීවිතයේ තීරණාත්මක අවස්ථාවලදී දේව කැමැත්ත පිළිගැනීම. ★ අභියෝගවලට සාර්ථකව මුහුණ දීම. ★ යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම. (යනාදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.) (ල. 05)

04. (1) ★ විශාල දරු පරපුරක් ★ සදාකාලයට හිමි වන දේශයක්. (ල. 02)
(2) ★ ආබ්‍රහම් තුමා ★ ඊසාක් තුමා ★ ජාකොබ් තුමා (ල. 03)
(3) ★ ශු. සභාවේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වීම. ★ අන් අයට ක්‍රිස්තුන් වහන්සේව හඳුන්වා දීම. ★ දස පනතට අනුව ජීවත් වීම. ★ පොරොන්දු ඉටු කිරීම. ★ ධර්මදූත සේවාව මගින් ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දැරීම. ★ මීසමේ පොදු වැඩ කටයුතු සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම. ★ මීසමේ සිදුකරන සමිති, සමාගම්වලට දායක වීම. (යනාදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.) (ල. 05)

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

05. (1) සිනාසීම (ල. 02)

(2) ★ බිය නොවන්න. නුඹ සමග ද මම සිටිමි. ★ නුඹට ආසිරි දෙමි. ★ මාගේ දාසයා වන ආබ්‍රහම් නිසා නුඹේ පෙළපත මම වැඩි වර්ධනය කරමි. (ල. 03)

(3) ★ දෙවියන් වහන්සේ කෙරෙහි අචල විශ්වාසයෙන් සිටීම. ★ දෙමව්පියන්ට කීකරු යහපත් දරුවෙකු වීම. ★ දෙමව්පියන්ගේ අවවාද වලට කීකරු වීම. ★ දෙවියන් වහන්සේට යාච්ඤා කිරීම. ★ ජීවිතයට පැමිණෙන දුක් කරදර ඉවසීමෙන් දරා ගැනීම. (යනාදි කරුණු සඳහා ලකුණු ලබා දෙන්න.) (ල. 05)

06. (1) ඒසව් පිළිබඳව ය. (ල. 02)

(2) ★ වරදක් කළ කල්හි එම වරද පිළිගෙන සමාව ලබාගත යුතුය. ★ තමාට වැරදි කළ අයට සමාව දිය යුතුය. ★ වචනයෙන් සමාව දී ක්‍රියාවෙන් ද එය ඔප්පු කළ යුතුය. ★ සහෝදරයා සමඟ සමගියෙන් ජීවත් විය යුතුය. (ල. 03)

(3) ★ සියලුදෙනා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම වැදගත් බව පෙන්වා දීම. ★ සියලු දෙනාම සහෝදර ප්‍රේමයෙන් ජීවත් විය යුතු බව. ★ වැරදි කරන අයට සමාව දීම දේව ඉගැන්වීමක් බව. ★ ඉවසීමෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව. ★ දසපනත කඩ කිරීමක් බව (යනාදි කරුණුවලට ලකුණු ලබා දෙන්න.)(ල. 05)